# ස්ථාවර නියෝග අංක 119 (4) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

# நிலையியற் கட்டளை இலக்கம் 119(4) பிரகாரம் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் பாராளுமன்றத்துக்கு சமர்ப்பித்த அறிக்கை தொடர்பிலான அவதானிப்புகளையும் மேற்கொண்ட நடவடிக்கைகளையும் சமர்ப்பித்தல்.

# Submission of observations and steps taken with regard to the reports presented to the Parliament by the Committee on Public Accounts in terms of theStanding Order No. 119(4)


පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
பாராளுமன்ற சபைமுதல்வரின் அலுவலகம்
Office of the Leader of the House of Parliament

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාර රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79
ආයතනයේ නම : පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය

| 2022 මූල්‍ය වර්ෂය සඳහා වූ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් රාජ්‍ය ආයතන ඇගයීමේදී හඳුනාගත් දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග/ වර්තමාන තත්වය |
|---|---|
| <u>1 කොටස</u><br><br>• **අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය හෝ අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබීම. විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම** | මේ වන විට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොසිටීම හේතුවෙන් අභ්‍යන්තර විගණන විමසුම් හෝ අවදානම් ලේඛනයක් යාවත්කාලීන කිරීමට නොහැකි විය. එබැවින් අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල නොකළ අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද විධිමත් අයුරින් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත් වර්තමානයේදී අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇති නිසා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය යයාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| <u>2 කොටස</u><br>• **හඳුනාගත් තුන්වන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50% කට වඩා අඩු මට්ටමක වීම** | සභානායක කාර්යාලයේ 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගෙන පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ විශේෂිත දර්ශක යටතේ විශේෂිත දර්ශක 02 ක් පමණක් ඇතුලත් කර තිබුනි. ඒ අනුව කාර්යසාධක දර්ශක දෙකක පමණක් තොරතුරු ඇතුලත් කළ යුතු වුවද අතපසුවීමකින් තුන්වන කාර්යසාධන දර්ශකය සම්බන්ධයෙන්ද තොරතුරු ඇතුලත් කර තිබුනි. ඉදිරියේදී එය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |

හර්ෂ විජේවර්ධන
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්